බයිබල් දැනුම මිනුම තරඟය - 2026 සිට

# ගිවිසුම්දායකයාණන් වන දෙවියන් වහන්සේ



## ගිවිසුම්දායකයාණන් හා සභානායකයාණන් වන දෙවියන් වහන්සේ

# කාණ්ඩය : 8 හා 9 ශ්‍රේණි

සැකසීම : ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

# බයිබල් දැනුම මිනුම තරඟය - ඔබගේ ප්‍රයෝජනය සඳහා

## 8 ශ්‍රේණිය - තේමාව

## ගිවිසුම්දායකයාණන් වන දෙවියන් වහන්සේ

| මාතෘකාව | ප්‍රධාන බයිබල් පරිච්ඡේද | ඉගෙනුම් ඵල | අමතර බයිබල් පාඨ | අරමුණ |
|---|---|---|---|---|
| ඒදන් උයනේ ගිවිසුම | උත්පත්ති 3:19-15, 21 | දරුවන් මිනිසාගේ වැටීමෙන් පසු දෙවියන් වහන්සේ දුන් ගැලවීමේ පළමු පොරොන්දුව ඉගෙන ගනියි. | උත්පත්ති 3:15<br>ගීතාවලිය 25:10<br>හෙබ්‍රෙව් 8:10 | බලාපොරොත්තු සහගත ගිවිසුම් ඉතිහාසය දෙවියන් වහන්සේ ආරම්භ කරන බව පෙන්වා දීම. |
| ආබ්‍රහම්තුමා සමඟ කළ ගිවිසුම | උත්පත්ති 12:1-3,7 | ▪ ආසිරි පැතීමේ නාමයක්<br>▪ දේශයක්<br>▪ පෙළපතක්<br>දෙවියන් වහන්සේගේ පොරොන්දු බව දැනගනියි. | උත්පත්ති 15:6<br>ගලාති 3:29<br>හෙබ්‍රෙව් 6:13-14 | දෙවියන් වහන්සේගේ ගිවිසුම විශ්වාසය හරහා ඇදහිල්ල ගොඩ නගන බව පෙන්වයි. |
| නෝවා සමඟ ගිවිසුම | උත්පත්ති 9:8-17 | දෙවියන් වහන්සේ ජලගැල්මෙන් පසු මැවිල්ල ආරක්ෂා කිරීමට දුන් පොරොන්දු අලුත් කරයි. | උත්පත්ති 9:11<br>යෙසායා 54:9<br>ගීතාවලිය 145:13 | දෙවියන් වහන්සේගේ කරුණාව හා ආරක්ෂාව ගිවිසුම් මඟින් පෙන්වන බව. |
| ජේසුස් වහන්සේ හා මරියතුමිය | ලූක් 2:22-40<br>ලූක් 2:41-47, 2:1-11<br>ජොහාන් 19:26-28 | ගිවිසුම් පූර්ණත්වයේ කේන්ද්‍ර ස්ථානය මරියතුමිය හා ජේසුස් වහන්සේ බව දකියි. | ජොහාන් 1:14<br>ගලාති 4:4<br>මතෙව් 1:23 | දෙවියන් වහන්සේගේ ගිවිසුම ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණත්වයට පත් වූ බව පෙන්වීමට. |
| ආශීර්වාදකාර බන්ධනය | මතෙව් 19:6 | විවාහය, ගිවිසුම් ආදරය හා විශ්වාසවන්ත බව තේරුම් ගනියි. | එපීස 5:25<br>1 කොරි 13:8<br>මලාකි 2:14 | දෙවියන් වහන්සේගේ විශ්වාසවන්ත ගිවිසුම් ආදරය ගැන මෙනෙහි කිරීමක් බව. |
| විශ්වාස ලක්ෂණය | අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය 2 හා 3 වගන්ති | දරුවන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි හා උන්වහන්සේගේ මිනිස් බව ගැනීම ගැන ගැඹුරින් විශ්වාස කරයි. | ජොහාන් 3:16<br>ජොහාන් 1:14<br>1 කොලොස්සි 1:15-16 | ජේසුස් වහන්සේගේ ජීවිතය හා මෙහෙවර තුළ දෙවියන් වහන්සේගේ ගිවිසුම් සම්පූර්ණ වූ බව. |
| යාච්ඤාවේ ගිවිසුම | සෙකරියස්ගේ ප්‍රශංසා ගීතය<br>ලූක් 1:68-79 | දරුවන් දෙවියන් වහන්සේගේ ගිවිසුම් පොරොන්දු සඳහා ප්‍රශංසා කරයි. | ලූක් 1:68<br>ගීතාවලිය 34:1<br>විලාප ගී 3:22 | දෙවියන් වහන්සේගේ කරුණාවට හා විශ්වාසනීයත්වයට කෘතඥතාවය දක්වයි. |

## බයිබල් දැනුම මිනුම තරඟය - ඔබගේ ප්‍රයෝජනය සඳහා

## 9 ශ්‍රේණිය - තේමාව ඃ ගිවිසුම්දායකයාණන් ලෙස දෙවියණ් වහන්සේ

| මාතෘකාව | ප්‍රධාන බයිබල් පරිච්ඡේද | ඉගෙනුම් ඵල | අමතර බයිබල් පාඨ | අරමුණ |
|---|---|---|---|---|
| මොසෙස්තුමා සමඟ ගිවිසුම | නික්මයාම 19:3-6 | දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව සමඟ ගිවිසුමක් ඇති කර ඔවුන්ව ශුද්ධභාවයට කැඳවූ බව තේරුම් ගනියි. | "නුඹලා මට පූජක ජාතියක් ද කැපවූ ජාතියක් ද වන්නහුය." නික්මයාම 19:6 | දෙවියන් වහන්සේගේ සැලැස්ම වනුයේ උන්වහන්සේගේ ජනතාව ශුද්ධව හා වෙන් කර තබා ගැනීම බව පෙන්වයි. |
| නව ගිවිසුම තුළ දිවැස් වැකි | ජෙරමියා 31:31-34 | ක්‍රිස්තුස් වහන්සේගේ පැමිනීමට සූදානම ගැන දෙවියන් වහන්සේගේ නීතිය මිනිස් හදවත් මත කොටා ඇති බව දැන ගනියි. | "මම මාගේ අණ පනත් ඔවුන් තුළ පිහිටුවා එය ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි." ජෙරමියා 31:33 | දෙවියන් වහන්සේ ඇතුලාන්තික පරිවර්තනයක් සමඟ සමීප සම්බන්ධතාවයක් අපේක්ෂා කරයි. |
| කල්වාරි ගිවිසුම | 1 කොරින්ති 11:23-26<br>ලූක් 22:20 | දිව්‍ය සත්ප්‍රසාදය අළුත් ගිවිසුම බවත් ජේසුස් වහන්සේගේ ජීවිත පූජාවට සම්බන්ධ වන බවත් හඳුනා ගනියි. | "එලෙසම භෝජනයෙන් පසු කුසලාන දී මේ කුසලානය ඔබ උදෙසා වගුරවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුමය."<br>ලූක් 22:20 | සෑම දිව්‍ය පූජාකවදීම ජේසුස් වහන්සේගේ මරණය හා ගැළවීමේ සහභාගීත්වය ප්‍රකාශ කරයි. |
| ගිවිසුම් කරඬුව වන මරියෝත්තමාවෝ | එළිදරව්ව 11:19<br>ලූක් 1:35 | කීකරුකමේ හා බැහැපත්කමේ පරමාදර්ශය ලෙස මරියතුමියව දකියි. | "ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහල වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභාවයද ඔබ වසාග න්නේය."<br>ලූක් 1:35 | සැබෑ කරඬුව වන ජේසුස් වහන්සේව රුගෙන ගිය බවත් මරියතුමිය ජේසුස් වහන්සේගේ කය දරාගත් බවත් දෙවියන් වහන්සේගේ සැලැස්මට විශ්වාසවන්තව සහයෝගය දක්වූ බව උගන්වයි. |

| | | | | |
|---|---|---|---|---|
| අපෝස්තුළුවරුන්ගේ කැඳවීම | මතෙව් 10:1-4<br>ලූක් 6:12-16 | දෙවියන් වහන්සේගේ කැඳවීම තුළ ස්ථිර වීමත් අපෝස්තලික දූත මෙහෙවරත් තේරුම් ගනියි. | ''ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් 12දෙනා තමන් වෙත කැඳවා අශුද්ධාත්මයන් දුරු කරන පිනිස ද සියලු ආකාර ලෙඩ රෝග සුව කරන පිණිස ද ඔවුන්ට බලය පවරා දුන් සේක.''<br>මතෙව් 10:1 | අපෝස්තුළුවරු ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දරමින් උන්වහන්සේගේ මෙහෙවර සභාව තුළ ඉදිරියටම කරගෙන යයි. |
| පූජකවරය ගිවිසුමක් ලෙස | ගීතාවලිය 110:4<br>හෙබ්‍රව් 5:1-10 | පූජකවරුන්ගේ හා රදගුරුවරුන්ගේ කාර්යභාරය ජීවිත කාලීන ගිවිසුමක් ලෙස දැන ගනියි. | ''නුඹ මෙල්කිසදෙක් පරපුරෙන් සදහටම පූජකයෙක් යැයි සමිඳාණෝ දිවුල සේක.''<br>ගීතාවලිය 110:4 | අධිකාරිත්වය, සේවාවේ අධ්‍යාත්මිකත්වය, වගකීම හා ගිවිසුම් ස්වභාවය ඉස්මතු කරන බව. |
| විශ්වාස ලක්ෂණය | අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය 4,5,9 වගන්ති | ගිවිසුම් පොරොන්දු හා සභා මෙහෙවර සම්බන්ධ කරමින් එම වගන්ති උච්චාරණය කර පැහැදිලි කරයි. | ''ධර්මයාණෝ මාංශගතව අප සමග වැඩ විසූ සේක.''<br>ජොහාන් 1:14<br><br>ධර්මදූත සේවාව පැවරීම.<br>මතෙව් 28:19 | ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේ හා ශු. සභාව තුළ තිබෙන්නා වූ විශ්වාසය ශක්තිමත් කරමින් ඇදහිල්ල හා ක්‍රියාව සම්බන්ධ කරයි. |
| යාච්ඤාව මරියාවන්ගේ උදාන ගීය | ලූක් 1:46-56 | දෙවියන් වහන්සේගේ දයා කරුණාව හඳුනා ගනිමින් ගිවිසුම් ප්‍රීතියේ හා තුති පිදීමේ ගීතයක් ලෙස යාච්ඤා කරයි. | ''මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි.''<br>ලූක් 1:46<br><br>''මහ නරපතීන් සිය සිහසුන් වලින් පහත හෙලා දීනයන් ඉහළ නංවා උසස් කළ සේක.<br>'' - ලූක් 1:52 | කෘතඥතාවයත් විශ්වාසයත් කීකරුකමත් දිරිමත් කරයි. |

# 8 ශ්‍රේණිය
# ගිවිසුම්දායකයාණන් වන දෙවියන් වහන්සේ

## I. ශුද්ධ ලියවිල්ල - දේව වචනය

### ප්‍රධාන පාඨ



**පැරණි ගිවිසුම**

- ඒදන් උයනේ ගිවිසුම - (උත්පත්ති 3:9-15, 21)
- ආබ්‍රහම්තුමා සමග ගිවිසුම - (උත්පත්ති 12:1-3 ,7)
- නෝවා සමග ගිවිසුම - (උත්පත්ති 9:8-17)

**නව ගිවිසුම**

- ජේසුස් වහන්සේ දේව මාළිගයේ කැපකිරීම - (ලූක් 2:22-40)
- ජේසුස් වහන්සේ දේව මාළිගයේ නැතිව සිට සම්භවීම - (ලූක් 2:41-47)
- කානානුවර විවාහ මංගල්‍යය - (ජොහාන් 2:1-11)
- කල්වාරියේ දී - (ජොහාන් 19:26-28)

### ඉගෙනුම් ඵල

- ගිවිසුමක් යනු තම ජනතාව සමග දෙවියන් වහන්සේ කළ ශුද්ධවූ පොරොන්දුවක් බව තේරුම් ගනියි.
- මරියතුමිය හා ජේසුතුමන් මධ්‍යස්ථ කොට ගෙන දෙවියන් වහන්සේගේ පොරොන්දු ඉෂ්ට වූ බව හඳුනා ගනියි.
- ගිවිසුම් කථාන්දර හා ක්‍රිස්තියානි ජීවිතය සඳහා ඒවායේ අර්ථයන් විස්තර කරයි.

### අමතර පාඨ

- "නුඹලා සමග පිහිටුවන ලද ගිවිසුම වනාහි මින් පසු කෙදිනකවත් ජලගැල්මකින් සියලු ජීවමාන සතුන් විනාශ කරනු නොලබන බවත් මින්පසු කෙදිනකවත් ජලගැලමකින් මහ පොළොව වනසනු නොලබන බවත්ය." - (උත්පත්ති 9: 11)
- "මම නුඹලා අතර වාසය කොට නුඹලාගේ දෙවියන් වහන්සේ වන්නෙමි. නුඹලා මාගේ සෙනග වන්නහුය." - (ලෙවී ව්‍යවස්ථාව 26:12)
- "එලෙසම මේ කුසලාන ඔබ උදෙසා වගුරුවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුමය." - (ලූක් 22:20)

❖ මෙම පාඨ මගින් දෙවියන් වහන්සේගේ පොරොන්දු හා සම්බන්ධතාවය ජේසුස් වහන්සේ තුළ සම්පූර්ණත්වයට පත්වූ ආකාරය සාරාංශ ගත කරයි.

## II. ඇදහිල්ලේ ප්‍රකාශනය - විශ්වාස ලක්ෂණය

ප්‍රධාන පාඨ

- **අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය 2 හා 3 පාඨ**
  - 2 පාඨය - උන්වහන්සේගේ ඒකජාත පුත්‍රයාණන් ද අපගේ ස්වාමීන් ද වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි මම විශ්වාස කරමි.
  - 3 පාඨය - ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවයෙන් කන්‍යා මරියාවන්ගෙන් උපන්නාහ.

### ඉගෙනුම් ඵල

- 2 හා 3 වගන්ති කියවා පැහැදිලි කරයි.
- ක්‍රිස්තුස් වහන්සේ හා මරිය තුමිය මඟින් ගිවිසුම් පොරොන්දු සම්පූර්ණ වූ ආකාරය මෙම වගන්ති දෙක මඟින් සම්බන්ධ කර පෙන්වයි.

### අමතර පාඨ :

1. "දේව වචනය මාංශගත වී අප සමග වැඩ විසූ සේක." - (ජොහාන් 1:14)
2. "එහෙත් කාලය සම්පූර්ණ වූ කළ දෙවියන් වහන්සේ ස්ත්‍රියකගෙන් උපත ලත් ව්‍යවස්ථාව යටතේ උපන් සිය පුත්‍රයාණන් එවා වදාළ සේක." - (ගලාති 4:4)
3. "මෙන්න කන්‍යාවක් ගැබ්ගෙන පුතෙකු බිහිකරන්නීය. උන්වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනු ඇත." (මතෙව් 1:23)

❖ ජේසුස් වහන්සේ මනුෂ්‍යත්වය ලැබීම තුළ ගිවිසුම් පොරොන්දු සම්පූර්ණ වූ බව දකින්නට මෙම පාඨයන් දරුවන්ට උදව් වෙයි.

## III. සක්‍රමේන්තු - ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිතය

### ප්‍රධාන පරිච්ඡේද

- ආශීර්වාදකාර බන්ධනය ගිවිසුමක් ලෙස - (මතෙව් 19:5-6)



### ඉගෙනුම් ඵල

- අශීර්වාදකාර බන්ධනය යනු ගිවිසුමක් බවත් එය කොන්ත්‍රාත්තුවක් පමණක් නොවන බවත් තේරුම් ගනියි.
- දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ජනතාවට දක්වන විශ්වාසනීය ආදරය විවාහය තුළින් දකියි.

### අමතර පාඨ :

1. "මෙසේ ඔවුහු එවක් පටන් දෙදෙනෙකු නොව එක්කෙනෙකු වෙති. එබැවින් දෙවියන් වහන්සේ එක් කළ අය මනුෂ්‍යා වෙන් නොකෙරේවා." - (මතෙව් 19:6)

2. "පුරුෂයෙනි ක්‍රිස්තුස් වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව වෙනුවෙන් සිය දිවි පුද කළාක් මෙන් ඔබත් ඔබගේ භාර්‍යාවන්ට ප්‍රේම කරන්න." - (එපීස 5:25)

3. "ප්‍රේමය සදාතනිකය." - (1 කොරින්ති 13:8)

❖ දෙවියන් වහන්සේගේ ආදර ගිවිසුම තුළ ඇති ප්‍රේමය, විශ්වාසනීයභාවය හා ඒකාබද්ධතාවය මෙම වගන්ති තුළින් පෙන්වයි.

## IV. යාච්ඤාව - ප්‍රශංසාව හා ස්තුතිදීම

**ප්‍රධාන පාඨය**

- සෙකරියස්ගේ ප්‍රශංසා ගීතය - (ලූක් 1:68-79)

**ඉගෙනුම් ඵල**

- ගිවිසුම් ප්‍රීතියේ හා තුති දීමේ ගීතිකාවක් ලෙස සලකා මෙම සෙකරියස්ගේ ප්‍රශංසා ගීතය කියවා යාච්ඤා කරයි.
- දෙවියන් වහන්සේගේ පොරොන්දු වලට තුති දෙමින් පෞද්ගලික යාච්ඤාවන් නිර්මාණය කරයි.

**අමතර පාඨ**

- ''ඉශ්‍රායෙල්හි දෙවි සමිඳාණන්, සිය සෙනඟ වෙත බලා කරුණාවෙන් විමුක්තිය සලසා දුන් බැවින් එතුමන් හට තුති පැසසුම් වේවා.'' - (ලූක් 1:68)
- ''හැම වෙලේ ම හිමි තුමන් හට මම ප්‍රශස්ති ගී ගයමි. එතුමන්ගේ ගුණ වැණුම් මා මුවින් තොර නොවෙයි. මම එතුමන්ගේ ගුණ වර්ණනා කරමි.'' - (ගීතාවලිය 34:1)
- ''සමිඳුන්ගේ තිර පෙම කිසි කලෙක පහව නොයන්නේ ය. එතුමන්ගේ දයාව කෙළවර නොවන්නේ ය.'' - (විලාප ගී 3:22)

❖ දෙවියන් වහන්සේගේ ''ගිවිසුම් විශ්වාසවන්තකම'' දෙස බලා අපටත් විශ්වාස කරන්නට කෘතගුණපූර්වක වන්නට හා ප්‍රීති වන්නට මෙම පාඨයන් දිරි ගන්වයි.

### ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යෝජනා

- කථාන්දර ක්‍රමය - පැරණි ගිවිසුම තුළ ගිවිසුම්, ජේසුස් වහන්සේ හා මරියතුමිය තුළ සම්පූර්ණ වූ ගිවිසුම
- දෘශ්‍යාධාර - දේදුන්න (නෝවා), තරු (ආබ්‍රහම්), කුරුසය (නව ගිවිසුම)
- රංගනය සමඟ ගායනය - සෙකරියාගේ ප්‍රශංසා ගීතය
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
    - ගිවිසුම් සංකේත චිත්‍රයට නැගීම (උදා දේදුන්න, මඟුල් මුදු)
    - ගිවිසුම් කථාන්දර නාට්‍ය ආකාරයෙන් රඟ දැක්වීම
    - දෙවියන් වහන්සේට පොරොන්දුවක් වෙමින් පෞද්ගලික යාච්ඤාවක් නිර්මාණය කිරීම



## තක්සේරුව හා ඇගයීම්


| අංශය | වර්ගය | ලකුණු |
|---|---|---|
| ලිඛිත වටය | බහුවරණ ප්‍රශ්න, හිස්තැන් පිරවීම, කෙටි පිළිතුරු | 40 |
| කටපාඩම් පද වටය | සෙකරියස්ගේ ප්‍රශංසා ගීය හා අමතර පාඨ | 20 |
| කථික හෝ චිත්‍ර වටය | ගිවිසුම් කථාන්දර හෝ මරියතුමී හා ජේසුස් වහන්සේගේ සිද්ධීන් | 20 |
| අවබෝධය (වාචික ප්‍රශ්න ඇසී-මේ) වටය | ගිවිසුම් සිද්ධීන් ආශ්‍රයෙන් ''ඇයි'' ප්‍රශ්න ඇසීම | 20 |

### සම්මාන මට්ටම

- රන් — 85–100
- රිදී — 70–84
- ලෝකඩ — 50–69
- සහතිකපත්‍ර — 50 අඩු

## අමතර පාඨ ඇතුලත් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාබ

- ප්‍රධාන කුළුනු හතර හරහා ඇති තේමාවන් වල සම්බන්ධය හා ඒකාබද්ධතාවය දරුවන් සොයා ගනියි.
- යාච්ඤාවට හා ඉගෙනුමට කෙටි කට පාඩම් පද සපයයි.
- ශුද්ධ ලියවිල්ලෙහි ද, සක්‍රමේන්තු සහ විශ්වාස ලක්ෂණය තුළ ද ගැබ් වී ඇති දෙවියන් වහන්සේගේ ගිවිසුම් ප්‍රේමය පිළිබඳ අවබෝධය ශක්තිමත් කරයි.



# 9 ශ්‍රේණිය

## ගිවිසුම්දායකයාණන් හා සභා නායකයාණන් වන දෙවියන් වහන්සේ

### I. ශුද්ධ ලියවිල්ල - ගිවිසුම් හා අපෝස්තුළුවරු

**ප්‍රධාන පාඨ**

1. මෝසෙස් සමඟ ගිවිසුම - (නික්මයාම 19:3-6)
2. අලුත් ගිවිසුම පිළිබඳ දිවැස්වැකිය - (ජෙරමියා 31:31-34)
3. කල්වාරි ගිවිසුම - (1 කොරින්ති 11:23-26, ලූක් 22:20)
4. ගිවිසුම් කරඬුව වන මරියෝත්තමාවෝ - (එළිදරව්ව 11:19, ලූක් 1:35)
5. අපෝස්තුළුවරුන්ව කැඳවීම - (මතෙව් 10:1-4, ලූක් 6:12-16)

**ඉගෙනුම් ඵල**

- පැරණි ගිවිසුම හා නව ගිවිසුම පුරා දිව යන දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ පොරොන්දුවක් ලෙස ''ගිවිසුම්'' අවබෝධ කර ගනියි.
- පැරණි ගිවිසුමේ සඳහන් ගිවිසුම් ජේසුස් වහන්සේ හා මරියතුමිය මඟින් ඉටු වූ බව පිළිගනියි.
- අපෝස්තලික මෙහෙවර හා එය ගිවිසුම් සේවය සමඟ සම්බන්ධතාවයක් ඇති බව තේරුම් ගනියි.
- නව ගිවිසුමේ ''ගිවිසුම් කරඬුව'' ලෙස මරියතුමියගේ භූමිකාව අගය කරයි.

**අමතර පාඨ**

- ''නුඹලා මට පූජක රාජ්‍යයක් ද, කැපවූ ජාතියක් ද වන්නහු ය.'' - (නික්මයාම 19:6)
- ''මම මාගේ අණපනත් ඔවුන් තුළ පිහිටුවා, එය ඔවුන්ගේ සිත් තුළ ලියන්නෙමි.'' - (ජෙරමියා 31:33)
- ''ඔබ යම් පමණ වර මේ රොටී අනුභව කරන්නහු ද, මෙම කුසලානයෙන් පානය කරන්නහු ද, එපමණ වර සමිඳාණන් වහන්සේ වඩින තුරු, ඔබ උන්වහන්සේගේ මරණය ප්‍රකාශ කරන්නහු ය.'' - (1 කොරින්ති 11:26)
- ''ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ද ඔබ වසා ගන්නේ ය.'' - (ලූක් 1:35)
- ''ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් කැඳවා ඔවුන්ට බලය පවරා දුන් සේක'' - (මතෙව් 10:1)

❖ මෙම පාඨයන් මඟින් දෙවියන් වහන්සේගේ විශ්වාසනීය සැලැස්ම, ගිවිසුම් සම්පූර්ණ වීම හා උන්වහන්සේගේ මෙහෙවරට සහභාගී වීමට කරන ආරාධනය බව අපට පෙන්වා දෙයි.

### II. ඇදහිල්ලේ ප්‍රකාශනය - විශ්වාස ලක්ෂණය

**ප්‍රධාන පාඨයන් -**

- අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය 4,5,9 වගන්ති
  - 4 වගන්තිය - උන්වහන්සේ ඒකජාතක පුත්‍රයාණන් ද අපගේ ස්වාමීන්ද වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ බව.
  - 5 වගන්තිය - ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවයෙන් කන්‍යා මරිය තුමියගෙන් උපන් බව.
  - 9 වගන්තිය - අපෝස්තුළුවරුන්ගෙන් පැවත එන එකම වූ ද ශුද්ධ වූ ද කතෝලික වූ ද හා අපෝස්තලික වූ ද සභාව ලෙස විශ්වාස කරන බව

**ඉගෙනුම් ඵල**

- මෙම වගන්ති (4,5 සහ 9) උච්චාරනය කර පැහැදිලි කරයි.
- ගිවිසුම් පොරොන්දුව ජේසුස් වහන්සේ හා අපෝස්තුළුවරු තුළ ඉටු වූ ආකාරය මෙම වගන්ති සමඟ සම්බන්ධ කරයි
- දෙවියන් වහන්සේගේ ගිවිසුම් සැලැස්ම, සභාව තුළින් අඛණ්ඩව ඉදිරියට රැගෙන ගිය බව හඳුනාගනියි.

අමතර පාඨ

- ''ධර්මයාණෝ මාංශගතව අප සමඟ වැඩ විසූ සේක.'' - (ජොහාන් 1:14)
- ''එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ශ්‍රාවකයින් කරන්න.'' - (මතෙව් 28:19)
- ''එහෙයින් ඔබ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ද වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝ ද වන්නහුය.'' - (1 කොරින්ති 12:27)

❖ මෙම පාඨයන් විශ්වාසය මෙහෙවර හා ශු. සභාවේ ගිවිසුම් ස්වභාවය පිළිබඳ අවබෝධ කර ශක්තිමත් කරයි.

## III. සක්‍රමේන්තු - පූජකවරය ගිවිසුමක් ලෙස

### ප්‍රධාන පාඨයන්

- පූජකවරය - ගීතාවලිය 110:4, හෙබ්‍රව් 5:1-10



### ඉගෙනුම් ඵල

- දෙවියන් වහන්සේ සමඟ යළි ජීවිත කාලයටම වලංගු ගිවිසුමක් ලෙස පූජකවර කාර්‍යය තේරුම්ගනියි.
- පූජකවරුන් හා රදගුරුවරුන් ක්‍රිස්තුස් වහන්සේගේ පූජකවර කාර්‍යයට සම්බන්ධ වන බව හඳුනා ගනියි.
- අපෝස්තලික කැඳවීම, ශු. සභාවේ සේවයට හා ශුද්ධත්වයට සම්බන්ධ කරයි.

### අමතර පාඨයන්

- ''නුඹ මෙල්කිසදෙක් පරපුරෙන් සදහටම පූජකයෙක් යැයි සමිදාණෝ දිවුල සේක'' - (ගීතාවලිය 110:4)
- ''සෑම නායක පූජකයෙක්ම පඬුරුත් පාපත් ඔප්පු කිරීම පිණිස ස්වකීය සෙනඟ අතුරින් තෝරාගෙන ඔවුන් වෙනුවෙන් දෙවියන් වහන්සේ සඳහා වූ කටයුතු කිරීම පිණිස පත් කරනු ලබයි'' - (හෙබ්‍රව් 5:1)
- ''මගේ බැටළුවන් පෝෂණය කරන්න'' - (ජොහාන් 21:17)

❖ මෙම පාඨවලින් පූජකවරයේ අධ්‍යාත්මික වගකීම්, අධිකාරී බලය හා ගිවිසුම් ස්වභාවය ඉස්මතු කරයි.

## IV. යාච්ඤාව - මරියාවන්ගේ උදාන ගීය

### ප්‍රධාන පාඨය - ලූක් 1:46-55

### ඉගෙනුම් ඵල

- ගිවිසුම් ප්‍රීතියේ, ප්‍රශංසාවේ සහ තුති දීමේ ගීතයක් ලෙස මරියාවන්ගේ උදාන ගීය ගයමින් යාච්ඤා කරයි.
- දුප්පතුන්ට හා නිහතමානී අය කෙරෙහි දෙවියන් වහන්සේගේ ඇති විශ්වාසවන්තභාවය හඳුනාගනියි.
- දේව ගිවිසුම තුළ මරියතුමිය, විශ්වාසවන්තකමේ හා කීකරුකමේ පරමාදර්ශයක් ලෙස දකියි.

### අමතර පාඨ

- ''මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි. මාගේ ආත්මය මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි.'' - (ලූක් 1:46-47)
- ''මහ නරපතීන් සිය සිහසුන්වලින් පහත හෙලා දීනයන් ඉහළ නංවා උසස් කළ සේක.'' - (ලූක් 1:52)
- ''අප පියවරුන් වූ ආබ්‍රහම්ට හා එම පරපුරට සදහටම පොරොන්දු වූ දයාව සිහිකරමින් සිය සේවක ඉශ්‍රායෙල් සෙනඟ හට පිහිට වූ සේක.'' - (ලූක් 1:54-55)

❖ මෙම පාඨ වලින් ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන් වහන්සේගේ ගිවිසුම් සැලැස්මට කෘතඥතාවයෙන්, විශ්වාසීව හා ක්‍රියාකාරීව සහභාගිවූ බව උගන්වයි.

## ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යෝජනාග



මෝසෙස්තුමාගේ ගිවිසුම

- කථාන්දර ක්‍රමය - මෝසෙස් සමඟ ගිවිසුම, නව ගිවිසුම පිළිබඳ අනාවැකි, කල්වාරි ගිවිසුම, අපෝස්තුළුවරුන්ගේ කැඳවීම

- දෘශ්‍යාධාර - නික්මයාමේ සිද්ධීන් (ගල්පුවරු), කුරුසය, ගිවිසුම් කරඬුව, අපෝසතලික සංකේත (යතුරු, මාළු, නැව)

- **නිර්මාණාත්මක ක්‍රියාකාරකම්**
  - ගිවිසුම් කරඬුව වන මරියතුමියව චිත්‍රයට නැගීම
  - අපෝස්තලික මෙහෙවර හෝ අන්තිම රාත්‍රී භෝජන ගිවිසුම රඟ දැක්වීම
  - මරියාවන්ගේ උදාන ගීයෙන් ආභාෂය ලත්/දිරිමත් වූ පෞද්ගලික යාච්ඤාවන් නිර්මාණය කරයි

- රංගනය සමඟ ගායනය
  - සෙකරියාගේ ප්‍රශංසා ගීතය

මරියතුමියගේ උදාන ගීතය

### තක්සේරුව හා ඇගයීම්

| අංශය | වර්ගය | ලකුණු |
|---|---|---|
| ලිඛිත වටය | බහුවරණ ප්‍රශ්න, හිස්තැන් පිරවීම, කෙටි පිළිතුරු | 40 |
| කටපාඩම් පද වටය | උදාන ගීය හා අමතර පාඨ | 20 |
| කථික හෝ චිත්‍ර වටය | ගිවිසුම් කථාන්දර හෝ මරියතුමී හා අපෝස්තුළුවරුන්ගේ සිද්ධීන් | 20 |
| අවබෝධය (වාචික ප්‍රශ්න වටය) | ''ඇයි'' ප්‍රශ්න (ගිවිසුම් සිද්ධීන් ආශ්‍රයෙන්) | 20 |

### සම්මාන මට්ටම

- රන් — 85–100
- රිදී — 70–84
- ලෝකඩ — 50–69
- සහතිකපත්‍ර — 50 අඩු

## අමතර පාඨ ඇතුලත් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාබ

- ශුද්ධ ලියවිල්ල, විශ්වාස ලක්ෂණය, සක්‍රමේන්තු සහ යාච්ඤාව හරහා ගිවිසුම් තේමාවන් හඳුනා ගෙන ශක්තිමත් කරයි.
- උච්චාරණය හා මෙනෙහි කිරීම සඳහා කටපාඩම් පද සපයයි.
- බයිබලය ගැන දැනුම ජීවමාන ක්‍රිස්තියානි ඇදහිල්ලේ ජීවිතය සමඟ සම්බන්ධ කරයි.